# කුරුවිට අධ්‍යාපන කොට්ඨාසය
# Kuruwita Educational Division

දෙවන වාර පරීක්ෂණය - 2019 7 ශ්‍රේණිය
**Second Term Test - 2019** **Grade 7**

සිංහල
**Sinhala**

පැය දෙකයි
**Two hours**

සැකසුම - **ර/ කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය**

නම :..........................................................................................................................................

- සියලුම ප්‍රශ්න පිළිතුරු සපයන්න.
- පහත සඳහන් වාක්‍යවලට ගැළපෙන කර්තෘ පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(01). . . . . . . . . . . . . . . . හෙට සවස ගමට යන්නෙහි.

1. මම 2. තොපි 3. තෝ 4. තෙපි

(02). . . . . . . . . . . . . . . . උදෑසනම කුඹුරට ගියේය.

1. ගොවියෝ 2. ගොවියන් 3. ගොවියා 4. ගොවියෙකු

- පහත සඳහන් වාක්‍යවලට ගැළපෙන ක්‍රියාපදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(03). මම දිනපතා බුදුන් . . . . . . . . . . . . . . .

1. වඳිමි 2. වඳිමු 3. වඳිති 4. වඳියි

(04). ගොවීහු කුඹුරේ වැඩ . . . . . . . . . . . . .

1. කරයි 2. කරති 3. කරහි 4. කරහූ

- පහත දී ඇති වචනයට ගැළපෙන විරුද්ධ පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(05). ප්‍රසිද්ධ

1. ප්‍රකට 2. පරසිඳු 3. පවර 4. අප්‍රසිද්ධ

(06). මිතුරා

1. සබඳ 2. සකි 3. සතුරා 4. මිතු

(07). මුකුලිත

1. විකසිත 2. තුලිත 3. සහස්පත 4. අරවින්ද

- පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.

(08). කටුස්සාගේ කරේ . . . . . . . බැන්දා වගෙයි.

1. රිදී 2. රත්තරන් 3. තඹ 4. පිත්තල

(09). ඌරන් කැකුණ තලන විට . . . . . . . . . . . . . . . . රජ මඟුල්.

1. වල් ඌරන්ට 2. මුවන්ට 3. හඹන් කුකුළන්ට 4. වැද්දන්ට

(10). ඉඟුරු දීලා . . . . . . . . . . . . ගත්තා වාගේ.
1. හාල් 2. පරිප්පු 3. මිරිස් 4. සූකිරි

- පහත සඳහන් වචනවල අර්ථය ලියන්න.

(11). ආචාරී භාග . . . . . . . . . . . .

(12). සිලිලාර . . . . . . . . . . . .

- පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(13). බමුණෝ යාග කරති. . . . . . . . . . . . .

(14). අපි මිහිරි හඬින් ගී කියමු . . . . . . . . . . . .

- නිවැරදි උක්ත පදය වරහන් තුළින් තෝරා ඉරක් අඳින්න.

(15). ( නැට්ටුවෝ / නැට්ටුවන් ) ලස්සනට නටති.

(16). ( ශිෂ්‍යාවක් / ශිෂ්‍යාවක ) තරඟයෙන් ජයග්‍රහණය කළාය.

(17). (ඇතා /ඇතෙකු ) ගඟට බැස දිය බිව්වේය.

(18). ( ගංගා /ගංගාවෝ ) මුහුදට ගලා බසිති.

(19). ( නුඹ / නුඹලා ) දේශනයට සහභාගී වන්නෙහු.

(20). ( ගායකයා /ගායිකාව ) ගීතයක් ගායනා කළේය.

( ලකුණු 2 x 20 = 40 )

## II - කොටස

- පළමු ප්‍රශ්නය, දෙවන ප්‍රශ්නය, තෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

(01). පන්ති කාමරය තුළ ඔබ විසින් සිදු කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ කණ්ඩායමට ලැබුණු ක්‍රියාකාරකම කුමක් ද?
ii. ඒ සඳහා ඔබ කණ්ඩායම් යොදාගත් තේමාව කුමක් ද?
iii. මේ සඳහා ගුරුතුමිය ඔබ කණ්ඩායමට ලබාදුන් උපදෙස් 03 ක් ලියන්න.
iv. එම ක්‍රියාකාරකම සිදු කිරීමේදී ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටලු 03 ක් ලියන්න.
v. එම ක්‍රියාකාරකම සිදු කිරීමේදී ඔබට පැවරුණු කාර්ය කුමක් ද?
iv. එම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ඔබ ලැබූ ප්‍රයෝජන 03 ක් දක්වන්න.

(ලකුණු 15 යි )

(02). පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු රචනාවක් ලියන්න.

i. වන අසිරිය
ii. පොදු දේපල සුරකිමු.
iii. අපි සතුන්ට කරුණාව දක්වමු.
iv. දහම් පාසල් අධ්‍යාපනයේ අගය

(ලකුණු 15 යි )

(03). ඔබ පාසලේ ශිෂ්‍ය නිල ලාංඡන පැළඳවීමේ උත්සවයට සහභාගී වන ලෙස දක්වමින් ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.

(ලකුණු 10 යි )

(04). පහත සඳහන් කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නෙලුම් මලේ පෙතිසලා
පුබුදුවමින් නොම තළා
බට්ට වටේ රේණු පොකුර
රතු පැහැයෙන් සරසලා

i. මෙම පද්‍ය උපුටාගත් පාඩම කුමක් ද?
ii. මෙම පද්‍යය රචනා කළේ කවුරුන් ද?
iii. මෙම කවියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?
iv. මෙහි සඳහන් විශේෂණ පදයක් ලියා දක්වන්න.
v. මෙහි සඳහන් සමූහාර්ථවාචී පදය ලියා දක්වන්න.

(ලකුණු 10 යි)

(05). ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ දුටුගැමුණු රජ සමයේ මහා විහාරයේ පෝයගේ වශයෙන් ඉදි කෙරුණු සත් මහල් ගොඩනැගිල්ල ප්‍රචලිත වූයේ ලෝහපාසාද හෙවත් ලෝවා මාහාපාය නමිනි. එහි අරුත වන්නේ '' ලෝහයෙන් තැනූ ගොඩනැගිල්ල '' යනුයි. මෙහි පියස්සට යොදන ලද්දේ තඹ උළු බව පැවසේ. විවිධ ලෝහ භාවිතයෙන් අතීත ලාංකිකයා නිර්මාණය කළ විවිධ කලා නිර්මාණ රාශියක් අප අතට පත්වී තිබේ. ඒ අතුරින් බුද්ධ ප්‍රතිමා, විවිධ බෝධිසත්ව හා දේව ප්‍රතිමා සහ විවිධ කරඬු ප්‍රමුඛස්ථානය උසුලයි.

i. ලෝවා මාහාපාය ඉදි කෙරුණේ කුමන සියවසක ද?
ii. එය කරවන ලද්දේ කවුරුන් විසින් ද ?
iii. '' ලෝවා මහා පාය '' යන්නෙහි අර්ථය කුමක් ද?
iv. මෙහි පියස්සට යොදා තිබුණේ මොනවා ද?
v. ලෝහ භාවිතයෙන් කළ නිර්මාණ 02 ක් ලියන්න. (ලකුණු 10 යි)

(06). පහත සඳහන් ප්‍රකාශය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'' කෑ තලයට මිල එපයි; ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව ''

i. මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද ?
ii. මෙම ප්‍රකාශය කළේ කා හට ද ?
iii. මෙම ප්‍රකාශය ඇතුළත් ගද්‍ය කෘතිය කුමක් ද ?
iv. එම කෘතිය ලියවුණු යුගය නම් කරන්න.
v මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද ? (ලකුණු 10 යි)

(07). පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන කවි දෙකක් නිර්මාණය කරන්න.
i. මාගේ මල්වත්තේ මල් පිපිලා හරි අගෙයි.
ii. මහ වැස්සයි ගංවතුරයි.
iii. මාගේ නංගි හරි හුරතල් (ලකුණු 10 යි)